සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# කතෝලික ධර්මය

6 ශ්‍රේණිය | කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

### I කොටස

- අංක 01 - 10 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. කිතුනුවන්ගේ අති පූජනීය ග්‍රන්ථය වන්නේ,

    (1) වේද ග්‍රන්ථය යි. (2) ත්‍රිපිටකය යි.
    (3) ශු. බයිබලය යි. (4) අල් කුරානය යි.

02. ශු. බයිබලයේ අඩංගු පොත් ගණන වන්නේ,

    (1) 46 කි. (2) 27 කි. (3) 73 කි. (4) 72 කි.

03. සෑම කිතුනු නිවසකම තිබිය යුත්තේ,

    (1) රූපවාහිනිය යි. (2) දුරකථනය යි.
    (3) පරිගණකය යි. (4) ශු. බයිබලය යි.

04. පංච පුස්තකය හඳුන්වන තවත් නමකි,

    (1) නීතිය (2) යාච්ඤාව
    (3) සාමය (4) හිංසාව

05. හෙබ්‍රෙව් බසින් පොත් පහ යන්න හඳුන්වන්නේ,

    (1) ෂාලොම් නමිනි. (2) ප්‍රොෆෙටෙස් නමිනි.
    (3) ටෝරා නමිනි. (4) නබී නමිනි.

06. පංච පුස්තකයට අයත් පොතක් වන්නේ,

    (1) ජෝෂුවා ය. (2) වීරාවලිය ය.
    (3) නික්මයාම ය. (4) රූත් කථාව ය.

07. ලූක් සුබාරංචියේ සංකේතය වන්නේ,

    (1) රාජාලියා ය. (2) ගවයා ය.
    (3) මිනිසා ය. (4) සිංහයා ය.

08. සුබාරංචි ග්‍රන්ථයක් රචනා කරන ලද එකම අන්‍ය ජාතිකයා වන්නේ,

    (1) ශු. මතෙව් තුමා ය. (2) ශු මාක් තුමා ය.
    (3) ශු. ජොහාන් තුමා ය. (4) ශු. ලූක් තුමා ය.

09. ශු. ජොහාන් තුමාගේ සහෝදරයා වන්නේ,

(1) ශු. මහා ජාකොබ් මුනිතුමා ය. (2) ශු. පේදුරු මුනිතුමා ය.

(3) ශු. තෝමස් මුනිතුමා ය. (4) ශු. ඇන්ඩෘ මුනිතුමා ය.

10. දෙවියන් වහන්සේ ලෝකය මැවීමේදී හතරවන දින මවනු ලැබුවේ,

(1) අහස හා ජලය ය. (2) මිනිසා හා සතුන් ය.

(3) ඉර, හඳ හා තාරකා ය. (4) පක්ෂීන් හා මසුන් ය.

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට ගැලපෙන පිළිතුර ලියන්න.**

11. ................................................. වගා කර, රැක බලා ගැනීමට දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ සේක.

12. මිනිසාට ජීවමාන බව ලැබුනේ ........................................................................................ තුළිනි.

13. මිනිසා සියලු ........................................................... ද අහසේ පක්ෂීන්ට ද සියලු මෘගයන්ට ද නම් තැබීය.

14. දෙවියන් වහන්සේගේ මැවීමේ කාර්යයෙහි පංගුකාරයින් කරගනු ලැබුවේ ..................................................... පමණි.

15. මිනිසා මැවීමත් සමඟම ..................................................................................... සම්පූර්ණ විය.

(ගව මහීෂයන්ට, මිනිසා, ජීවන හුස්ම, දූවිල්ලෙන්, දේව මැවිල්ල, ඒදන් උයන)

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. ජේසුස් වහන්සේගේ උපත පිළිබඳව මරියතුමියට දැනුම් දෙන්නේ ගාබ්‍රියල් නම් දේවදූතයා විසිනි. ( )

17. ජේසුස් වහන්සේගේ උත්පත්ති සමයේ සංගණනයක් ගැනීමට නියෝගයක් නිකුත් කරන ලද්දේ හෙරෝද් රජතුමා විසිනි. ( )

18. එළිසබෙත් තුමිය මරියතුමියගේ ඥාතිවරියකි. ( )

19. ජේසුස් වහන්සේගේ දෙමව්පියෝ අවුරුදු පතා පාස්කු උළෙල සඳහා ජෙරුසලමට ගියහ. ( )

20. ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳව රචනා කරන ලද්දේ ශු. මතෙව් තුමා විසිනි. ( )

(ල. 5x2 = 10)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (1) ශු. බයිබලයේ ප්‍රධාන කොටස් 02 නම් කරන්න.

(2) පැරණි ගිවිසුමට අයත් පොත් 02 ක් නම් කරන්න.

(3) පංච පුස්තකය හඳුන්වන නම් 02 ක් ලියන්න.

(4) ශු. මතෙව් තුමා පිළිබඳව කරුණු 02 ක් ලියන්න.

(5) ජේසුස් වහන්සේ බැහැදැකීමට ගිය ශාස්ත්‍රවන්තයින් ගෙන ගිය තුටු පඬුරු 02 ක් නම් කරන්න.

(6) දෙවියන් වහන්සේ මිනිසා මවා ඇත්තේ දෙවියන් වහන්සේගේ කුමන ලක්ෂණ 2 අනුවද ? ලියා දක්වන්න.

(7) ජේසුස් වහන්සේගේ ළමා ජීවිතයෙන් ගත හැකි ආදර්ශ 02 ක් ලියන්න.

(8) ජුදා ජාතිකයින්ගේ ආගමික හා ජාතික චාරිත්‍ර 02 ක් ලියන්න.

(9) ශු. ජොහාන් අපෝස්තුළුතුමාගේ මව හා පියා නම් කරන්න.

(10) ස්නාවක ජොහාන් තුමාගේ මව හා පියා නම් කරන්න. (ල. 2x10=20)

02. (1) පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ පොත් ගණන වෙන වෙනම ලියන්න. (ල. 02)

(2) ශු. බයිබලය තැන්පත් කිරීමේ දී අනුගමනය කළ යුතු දේවල් 03 ක් ලියන්න. (ල. 03)

(3) දේව වචනය ළමා ඔබේ ජීවිතයට වැදගත් වන ආකාර 05 ක් ලියන්න. (ල. 05)

03. (1) ශු. බයිබලය රචනා කිරීමේදී පදනම් කර ගත් කරුණු 02 ක් ලියන්න. (ල. 02)

(2) උත්පත්ති පොතේ සඳහන් කරුණු 03 ක් ලියන්න. (ල. 03)

(3) මෝසෙස් තුමා මෙන් ඔබද නායකත්වය ගෙන කටයුතු කරන ආකාර 05 ක් ලියන්න. (ල. 05)

04. (1) ජුසේ තුමා දාවිත්ගේ ............................... හා ........................... අයිති අයෙකි. හිස්තැන් පුරවන්න. (ල. 02)

(2) මරිය තුමියගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ 03 ක් ලියන්න. (ල. 03)

(3) නත්තල් දින ඔබ විසින් සිදු කළ යුතු යහපත් ක්‍රියා 05 ක් ලියන්න. (ල. 05)

05. (1) කුළුඳුල් පිරිමි දරුවන් කැපකිරීමේ දී ඔප්පු කරනු ලබන සතුන් දෙදෙනෙකු ලියන්න. (ල. 02)

(2) ජේසුස් වහන්සේ ළමා කාලයේ වර්ධනය වූ ආකාර 03 ක් ලියන්න. (ල. 03)

(3) ජේසුස් වහන්සේ තම දෙමාපියන්ට කීකරු වූයේ කෙසේදැයි කරුණු 05 කින් ලියන්න. (ල. 05)

06. (1) 'දෙවියන් වහන්සේ ආසිරි පතමින් නුඹලා.............. ලබා .............. වී පොළව පුරා පැතිර එය යටත් කර ගන්න. හිස්තැන් පුරවන්න. (ල. 02)

(2) දෙවියන් වහන්සේ ලෝකය මවා, මිනිසාට පැවරූ වගකීම් 03 ක් ලියන්න. (ල. 03)

(3) පරිසරය සම්බන්ධ ව ඔබගේ වගකීම් 05 ක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 3 ) 02. ( 3 ) 03. ( 4 ) 04. ( 1 ) 05. ( 2 ) 06. ( 3 ) 07. ( 2 ) 08. ( 4 ) 09. ( 1 ) 10. ( 3 )

11. ඒදන් උයන 12. ජීවන හුස්ම 13. ගව මහීෂයන්ට 14. මිනිසා 15. දේව මැවිල්ල

16. (✓) 17. (X) 18. (✓) 19. (✓) 10. (X)

## II කොටස

01. (1) ★ පැරණි ගිවිසුම ★ නව ගිවිසුම (2) පැරණි ගිවිසුමට අයත් පොත් වලින් ඕනෑම 2 ක්.
(3) නීතිය, ව්‍යවස්ථාවලිය ★ මොසෙස්ගේ නීතිය ★ මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාවලිය
(4) ★ අයබදු එකතු කළ අයකැමියෙකි. ★ ජේසුස් වහන්සේගේ ගෝලයෙකි.
(5) රන්, තුවරලා, ගන්ධරස (6) ස්වරූපය හා සමානකම
(7) සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න.
(8) ★ අටවන දින චර්මඡේදනය කිරීම. ★ නම් තැබීම. ★ පිරිසිදු වීමේ පිළිවෙත් සිදු කිරීම. ★ කුළුඳුල් දරුවන් දෙවියන් වහන්සේට කැප කිරීම.
(9) මව - සලෝමි පියා - සෙබදි
(10) මව - එළිසබෙත් තුමිය පියා - සෙකරියස් තුමා

02. (1) ★ පැරණි ගිවිසුම - 46 ★ නව ගිවිසුම - 27
(2) ★ පිරිසිදු ස්ථානයක සුදු රෙදිකඩක් මත තැබීම. ★ පහනක් තැබීම. ★ මල් තැබීම.
(3) සිසුවා ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න.

03. (1) විශ්වාසය හා බලාපොරොත්තුව
(2) ★ දෙවියන් වහන්සේ විශ්වය හා මිනිසා මැවීම. ★ ආදම් සහ ඒව පාපයට වැටීම. ★ කායින් හා ආබෙල් පිළිබඳ කතා පුවත. ★ නෝවා හා ජල ගැල්ම. ★ මිනිසා ඉදිකළ බාබෙල් කොත.
(3) ★ පන්තියේ නායකත්වය දැරීම. ★ නායකත්වයට අවංක වීම. ★ සාධාරණව කටයුතු කිරීම. ★ ප්‍රශ්න පැන නගින අවස්ථාවලදී මැදිහත් වී ඒවා නිරාකණය කිරීම. ★ යාච්ඤාවෙන් නායකත්වය සවිමත් කර ගැනීම.

04. (1) වංශයට හා පෙළපතට
(2) ★ නිහතමානීකම ★ පරිත්‍යාගශීලී බව ★ අන් අයට දයාව දැක්වීම යනාදි කරුණු
(3) ★ දිව්‍ය පූජාවට සහභාගී වීම. ★ අසරණයන්ට උදව් කිරීම. ★ රෝගීන් බැහැ දැකීම. ★ නැති බැරි අය සමඟ බෙදා හදා ගැනීම. ★ දුකින් සිටින්නන් සැනසීම යනාදි කරුණු.

05. (1) පරවියන් සහ කොබෙයියන්
(2) ★ ප්‍රඥා මහිමයෙන් ★ කාය ශක්තියෙන් ★ දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාද ලබමින්....
(3) ★ මරියතුමියට කීකරු වීම. ★ ජුසේතුමාගේ කටයුතුවලට සහය වීම. ★ දෙමාපියන් සමඟ යාච්ඤා කිරීම. ★ වයස අවු: 12 දී දෙමාපියන් සමඟ දේව මාලිගාවට යාම. ★ පවුලේ සමගිය වෙනුවෙන් කටයුතු කිරිම.

06. (1) දරු සම්පත් / වැඩි වර්ධනය
(2) ★ දරු සම්පත් ලැබීමට. ★ පොළොව පුරා පැතිර යාමට ★ සියලුම සතුන් බලා ගැනීම, වර්ධනය කිරීම, මානව අවශ්‍යතා සඳහා යොදා ගැනීම. ★ පොළවේ වගා කිරීමට.
(3) ★ පොලිතින් භාවිතයෙන් තොරවීම. ★ ගස් සිටුවීම. ★ සතුන්ව ආරක්ෂා කිරීම යනාදි කරුණු